**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය -2021**

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2021 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2639 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2639/2640 (එස්එෆ්) එස්ආර්අයි දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සහ 2012 නොවැම්බර් 19 දිනැති අංක 2890 (එස්ආර්අයි) (එස්එෆ්) සහ අංක 2891( එස්ආර්අයි) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.04 සහ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

---

ණය ගිවිසුම්වලට අනුව, එවකට වරාය සහ මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ කටයුතු කළමනාකරණය සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිනු ලැබේ. උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ගයවල කිලෝමීටර් 170ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,790 කට සමාන එජඩො මිලියන 146 ක් වූ අතර ඉන් රු.මිලියන 14,950කට සමාන එජඩො මිලියන 130ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. තවද, 2012 නොවැම්බර් 12 දිනැති 2890 එස්ආර්අයි (එස්එෆ්) දරන අතිරේක ණය ගිවිසුම යටතේ රු.මිලියන 8,840කට සමාන එජඩො මිලියන 68ක් ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර ඉන් රු.මිලියන 4,420කට සමාන එජඩො මිලියන 34ක් උතුරු සහ උතුරු මැද පළාත්වල පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වෙන්කර තිබුණි. ඊට අමතරව 2012 නොවැම්බර් 12 දිනැති 2891 එස්ආර්අයි දරන ණය ගිවිසුම යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ගය සඳහා රු.මිලියන 3,900කට සමාන එජඩො මිලියන 30ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු මුල් ණය ගිවිසුම යටතේ 2010 ඔක්තෝම්බර් 22 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිමකර තිබුණි. අතිරේක මූල්‍ය පහසුකම් යටතේ ව්‍යාපෘතියේ කටයුතු 2013 මැයි 13 දින ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර එය 2021 සැප්තැම්බර් 3 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

---

ව්‍යාපෘතියේ 2021 සැප්තැම්බර් 30 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි.තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දූස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන ගැටලුව | කළමණාකරනයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතිය ඇවර කිරීමේ ගිණුම් 2021 සැප්තැම්බර් 30 දිනට පිළියෙල කර තිබුණද එකතුව රු. මිලියන 1.35 පෙර ගෙවීම් සහ අත්තිකාරම් හා එකතුව රු. මිලියන 1.14ක තැන්පත් නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් ජංගම වත්කම් සහ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | මෙම මුදල වෙනත් ආදායම් ලෙස විවිධ පාර්ශවයන්ගෙන් ලැබුණු අරමුදල් නියෝජනය කරනු ලබයි. මෙම මුළු මුදල මහාමාර්ග අමාත්‍යංශ ලේකම් ගිණුමට මාරුකර ඇත. | සියළුම වගකීම් සහ ලැබීම් ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙර නිරවුල් කළ යුතුය. |

**2.2 නීති,රීති, සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති, සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ | ව්‍යාපෘතියේ ගනුදෙනු මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් වී නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයෙන් මෙම ගැටලුව පිළිබඳ විමසීමේදී ඔවුන් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිගේ නියෝගවලට යටත් අතර මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති නියෝගයක් ලබා දෙන්නේ නම් පමණක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ විගණනය ඔවුන්ට කළ හැකි බව අප වෙත දන්වා ඇත. | ව්‍යාපෘතියේ ගනුදෙනු මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබද භෞතික ප්‍රගතිය**

ලැබී තිබුණු තොරතුරු අනුව, පුනරුත්ථාපනය කළ ජාතික මාර්ග 3ක වර්ෂ 3ක කාර්යසාධනය මත නඩත්තු කටයුතු ඇතුළුව උතුරු සහ උතුරු මැද පළාත්වල කොන්ත්‍රාත් පැකේජ 10ක් යටතේ පිරිනමන ලද ජාතික මාර්ග 6ක කිලෝමීටර 170ක පුනරුත්ථාපන කටයුතු 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. තවද, ආරම්භක ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ මාර්ග පුනරුත්ථාපනය මත ඉතුරුම් භාවිතයෙන් අනෙකුත් ජාතික මාර්ග 2හි පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුව 2015 පිරිනමා තිබුණු අතර 2016 වර්ෂයේදී නිම කර තිබුණි. ඊට අමතරව 2016 දෙසැම්බර් 31 දිනට අතිරේක මූල්‍ය පහසුකම් යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ග 7ක කිලෝමීටර 122ක වෙනත් කොටස් පුනරුත්ථාපන කටයුතු අවසන් කර තිබුණි. ණය මුදලෙහි ඉතුරුම් වලින් මහනුවර යාපනය මාර්ගයේ (ඒ 009) රබෑව සිට මැදවච්චිය දක්වා කොටසේ කිලෝමීටර 9.64ක් පුනරුත්ථාපනය සඳහා 2017 අප්‍රේල් 28 දින නව කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර 2018 ඔක්තෝබර් 31 දිනට නිමකර තිබුණි. තවද, ව්‍යාපෘතිය මැදවච්චිය හෙරොව්පතාන මාර්ගය පුනරුත්ථාපනය සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් අනුමැතිය ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා කොන්ත්‍රාත් 2ක් පිරිනමා තිබුණි. කෙසේවෙතත්, පුනරුත්ථාපනය කටයුතු 2020 වර්ෂයේදී නිමකර තිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ව්‍යාපෘතිය විසින් 2021 අවසාන දිනට උතුරු සහ උතුරුමැද පළාතේ ජාතික මාර්ග 12ක් සඳහා එකතුව රු. මිලියන 11,609.72ක් වැයකර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තිය අනුව, ව්‍යාපෘති විචලාතා පිරිවැය අවමකර ගැනීමට උත්සාහ කළ යුතුය. කෙසේවෙතත්, එම මුදලින් විචලා ලෙස රු. මිලියන 480.7ක් ගෙවා තිබුණි. ඉන් රු. මිලියන 47.62ක් ගොඩනැගිලි ඉදිකිරීමට සහ රු. මිලියන 3.08ක් මාර්ග ඉදිකිරීමට සම්බන්ධ නොමැති වාහන මිළදී ගැනීම සඳහාත් ගෙවා තිබුණි. | එම වාහන කොන්ත්‍රාත්තුවේ ඇති තාවකාලික මුදල යටතේ මිළදීගෙන ඇතිබව සඳහන් සඳහන් කරනු ලැබේ. කෙසේවෙතත්, කොන්ත්‍රාත්තුව තුළ ඇති මුදල ඉක්මවීම හේතුවෙන් විචලාතා ආරම්භ කර ඇත. වාහන කොන්ත්‍රාත් අධීක්ෂණය සහ නියාමනය සඳහා පමණක් සපයා ඇත. කොන්ත්‍රාත්තුව අවසානයේදී සියලුම වාහන මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී ඇත. | ව්‍යාපෘතියේ අවශ්‍යතා ව්‍යාපෘතිය ආරම්භක අදියරේදී හඳුනා ගැනීම අවශ්‍ය වේ. |